# ජාත්‍යන්තර වෙළෙඳාම (International Trade Law)

ජාත්‍යන්තර වෙළෙඳාම යනු රටවල් දෙකක් අතර භාණ්ඩ මිලට ගැනීම හා එක් රටක සිට තවත් රටකට භාණ්ඩ ප්‍රවාහනය කිරීම වැනි කරුණු අරභයා ඇතිකරගනු ලබන ගිවිසුම් සම්බන්ධ නීති. මේවා වර්ග දෙකකට බෙදේ.

1. ජාත්‍යන්තර භාණ්ඩ විකිණීමේ නීතිය.
2. ජාත්‍යන්තර සේවා සැපයීමේ ගිවිසුම.

(1) අන්තර්ජාතික වෙළඳාමේදී යොදාගනු ලබන ගිවිසුම් වර්ග 03 කි. ඒවා අතරින් වැඩි වශයෙන් යොදාගනු ලබන ප්‍රධාන ගිවිසුම් දෙක වන්නේ FOB සහ CIF වේ. FOB සහ CIF ගිවිසුම් අතර ඇති ප්‍රධාන වෙනස්කම් දක්වන්න.

FOB නැතහොත් Free on Board ගිවිසුමකදී භාණ්ඩ නැවට පැටවීම සම්බන්ධ වන සියළු වියදම් විකුණුම්කරු විසින් දැරිය යුතුයි. මෙහිදී විකුණුම්කරු සතු භාණ්ඩ භාරදීමේ වගකීම නැවට භාණ්ඩ පැටවීමත් සමගම සම්පූර්ණ වේ. භාණ්ඩ නැවට පැටවීමත් සමග භාණ්ඩවල හිමිකාරීත්වය ගැණුම්කරුට පැවරේ. FOB ගිවිසුමකදී ගැණුම්කරු විසින් නැව් කුලිය සහ රක්‍ෂණ ගාස්තු දැරිය යුතුය.

එහෙත් CIF නොහොත් Cost Insurance and Freight ගිවිසුමකදී විකුණුම්කරු විසින් ගැණුම්කරු වෙත භාණ්ඩ භාරදීමේදී නොව අදාළ නෞකා ප්‍රවාහන ලියවිලි භාරදීමේදී ගිවිසුම ඉෂ්ඨ වේ. CIF ගිවිසුමට භාණ්ඩ පිරිවැය, රක්‍ෂණ ගාස්තු හා නැව් කුලියද අදාළ වන බැවින් එකී සියළු වියදම් දැරිය යුත්තේ විකුණුම්කරු විසිනි.

### ජාත්‍යන්තර වෙළඳාමේදී මූල්‍ය පහසුකම් ලබාදීම
### Finance in International Trade

ජාත්‍යන්තර වෙළඳාමේදී ගෙවීම් කිරීමේ ක්‍රමවේදය මූලික කරුණක් වේ. සාමාන්‍යයෙන් මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා වන ජාත්‍යන්තර වෙළඳ ගිවිසුමකදී පහත දක්වෙන කරුණු වලට අනුව ගෙවීමේ ක්‍රමවේදයට සම්බන්ධ වගන්තියේ අනිවාර්යෙන් ඇතුළත් වේ.

1) ගෙවිය යුතු කාලසීමාව
2) ගෙවිය යුතු ක්‍රමවේදය
3) ගෙවිය යුතු ස්ථානය
4) ගෙවිය යුතු මුදල් වර්ගය

ජාත්‍යන්තර වෙළඳ ගිවිසුමක විකුණුම්කරුගේ වැඩි අවධානය යොමු වන්නේ භාණ්ඩ ලබාදුන් වහාම එහි විකුණුම් මිල හැකිතාක් ඉක්මණින් ලබා ගැනීමයි. ගැණුම්කරුගේ ඉලක්කය වන්නේ ගෙවීම් හැකිතාක් ප්‍රමාද කිරීමයි. අවම වශයෙන් භාණ්ඩ විකිණීමට අදාළ ලේඛන තමා වෙතට ලැබෙන තුරාවත් ප්‍රමාද කිරීමයි. මෙම අරමුණු දෙක අතර ගැටුම අවම කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ බැංකු නව ක්‍රමවේද හඳුන්වා දී තිබේ. ඒවා අතර විනිමය බිල්පත් ප්‍රධාන වේ.

ජාත්‍යන්තර වෙළඳාමේදී ගෙවීම් බොහෝවිට සිදුවන්නේ විනිමය බිල්පත් මගිනි. එය වඩා ආරක්‍ෂාකාරී මෙන්ම වගකීම් සහිත වීම නිසා මෙම ක්‍රමය ජනප්‍රිය වී තිබේ. මීට අමතරව ජාත්‍යන්තර වෙළඳාමේදී ගෙවීම් කරන තවත් ක්‍රම කිහිපයක් ඇත.

1) විනිමය බිල්පත්
2) ඒකාබද්ධ ගෙවීම් එකතු කිරීමේ ගිවිසුම්
3) අයිරාව (Letter of Credit)

4) විවෘත ගිණුමකින් කරනු ලබන ගෙවීම්
5) අත්තිකාරකමකින් ගෙවීම
6) ඉලෙක්ට්‍රොනික් වාණිජ්‍යය - ඉලෙක්ට්‍රොනික් වාණිජ්‍ය යනු අන්තර්ජාලය භාවිතා කරමින් වාණිජ ගිවිසුම් වලට එළඹීමයි. මෙය ශ්‍රී ලංකාවේදී 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පිළිබඳ පනත මගින් පිළිගෙන ලංකාවේ නීතියේ කොටසක් බවට පත් වී ඇත.

(1) ජාත්‍යන්තර වෙළඳාම ගණුදෙනුවලදී භාවිතා වන භාණ්ඩ ප්‍රවාහන කුවිතාන්සිය යනු කුමක්ද? (Bills of Lading)

භාණ්ඩ ප්‍රවාහන කුවිතාන්සිය යනු ජාත්‍යන්තර වෙළඳාමේදී ඇණවුම් කරන ලද භාණ්ඩ නියමිත ගමනාන්තය වෙත ප්‍රවාහනය කරනු ලැබූ බව සනාථ කෙරෙන කුවිතාන්සියකි. මෙය භාණ්ඩ ප්‍රවාහනය කරන නැව් සමාගම සහ එය ප්‍රවාහනය භාරගත් ආයතනය අතර හටගන්නා ගිවිසුම අතර ප්‍රබල සාක්ෂියයි. මෙම භාණ්ඩ ප්‍රවාහන කුවිතාන්සිය අන් අයෙකුට පැවරීමට ද හැකියාව ඇත.

**2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත**

ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් බලපාන නීතියකි. මෙහිදී කතෘත්ව අයිතිය ප්‍රකාශන අයිතිය (Copy Right & Publication Right) සහ පේටන්ට් අයිතිය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි.

01. කතෘත්ව අයිතිය (Copy Right) / ප්‍රකාශන අයිතිය (Publication Right)

කිසියම් ග්‍රන්ථයක් සම්පාදනය කරන කර්තෘවරයකුට ගීතයක් ලියන රචකයෙකුට සිනමා පටයක් හෝ ටෙලිනාට්‍යක් නිර්මාණය කරන අධ්‍යක්ෂවරයෙකුට තම නිර්මාණය සම්බන්ධයෙන් ඇති අයිතිය මේ නමින් හැඳින්වේ. ඔහුගේ අවසරය නොලබා එම කෘතිය හෝ ඉන් කොටසක් උපුටා ගැනීම බුද්ධිමය දේපළ පනතට අනුව තහනම් වේ. කතුවරයෙකුගේ අයිතිය බුද්ධිමය දේපළ පනතට අනුව ඔහුගේ මරණින් පසුවත් අවු. 70 ක් දක්වා ඔහුගේ උරුමකරුවන්ට ලැබේ.

02. පේටන්ට් අයිතිය (Patent Right)

කිසියම් නව නිර්මාණයක් බිහිකරන නිෂ්පාදකයෙකුට වසර 20 ක් සඳහා එම නව නිර්මාණයට ලබාගන්නා පේටන්ට් බලපත්‍රයෙන් අයිතිවාසිකම ආරක්ෂා වේ.

**වෙළෙඳ නාම සහ වෙළෙඳ ලකුණු**

වෙළෙඳ නාම යනුවෙන් අදහස් වන්නේ කිසියම් වෙළෙඳ ආයතනයක් හෝ ස්වභාවික පුද්ගලයෙක් හඳුනාගැනීම පිණිස යොදාගන්නා නාමයයි. මෙම වෙළෙඳ නාම බුද්ධිමය දේපළ පනත යටතේ බුද්ධිමය දේපළ කාර්යාංශයේ ලියාපදිංචි කළ හැකිය. එම ලියාපදිංචිය වසර 10 කට වරක් අළුත් කළ යුතුය. එසේම ආගම් වලට හෝ ජාතීන්ගේ හැඟීම් වලට හානි කරවන වෙළෙඳ නාම භාවිත කිරීම පනත යටතේ තහනම් වන අතර ඒවා ලියාපදිංචි කිරීමද ප්‍රතික්ෂේප කෙරේ.

බුද්ධිමය දේපළ වැරදි සම්බන්ධයෙන් පනතේ 160 වගන්තිය යටතේ අයුතු අසාධාරණ වෙළෙඳ තරගයක නියතු වීමද තහනම් කර ඇත. ඒ යටතේ එක හා සමාන නම් වලින් නිෂ්පාදන ඉදිරිපත් කිරීම, මහජනතාව නොමග යවන සුළු ආකාරයෙන් නිෂ්පාදනවලට නම් යෙදීම තහනම් කර ඇත. මේ සම්බන්ධව නඩු පැවරීමේදී බුද්ධිමය දේපළ සම්බන්ධ සිවිල් නඩු වාණිජ මහාධිකරණයේත්, අපරාධ නඩු මහේස්ත්‍රාත් අධිකරණයේදීත් පවරනු ලැබේ.

**2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත**

මෙරට පරිගණක ආශ්‍රිතව සිදුවන අපරාධ වැළැක්වීම සඳහා මෙම පනත පනවා ඇත.

**2006 අංක 05 දරණ මූල්‍ය විශුද්ධිකරණ පනත**

ශ්‍රී ලංකාවේ කළු සල්ලි මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රවාහනයට එකතු කරගැනීමේ අරමුණින් හා පහත දක්වෙන වැරදි වැළැක්වීම සඳහා මෙය පනවා ඇත.

i. මත්ද්‍රව්‍ය වැරදි
ii. පුද්ගල ජාවාරම්
iii. අල්ලස්
iv. විනිමය වංචා
v. ත්‍රස්තවාදයට මුදල් සැපයීම
vi. ජාත්‍යන්තර සංවිධාන අපරාධ මැඬීම
vii. සයිබර් අපරාධ, ගිණි අවි, පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැරදි වැළැක්වීම
viii. ළමුන්ට එරෙහි අපරාධ වැළැක්වීම
ix. පිරමීඩ මුදල් ක්‍රම වැළැක්වීම

(1) තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ලංකාවේ පනවා ඇති නීතිමය ප්‍රතිපාදන මොනවාද?

i. 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත
ii. 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පිළිබඳ පනත
iii. 2006 අංක 30 දරණ ගෙවීම් උපක්‍රම වංචා කිරීම් වැළැක්වීමේ පනත (මෙය credit card සඳහා සෘජුවම බලපායි)
iv. 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත
v. 2003 අංක 27 දරණ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පනත
vi. 2005 අංක 28 දරණ ගෙවීම් සහ සමත කිරීම් විධික්‍රම පනත
vii. 1995 අංක 14 දරණ සාක්ෂි විශේෂ විධිවිධාන පනත (මෙරට තුළ පටිගත කළ, තැටිගත කළ, පරිගණකගත කළ සාක්ෂි පිළිගැනීම මෙමගින් සිදු විය.)
viii. 1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ 2003 සම්මත කරනු ලැබූ අන්තර් සබඳතා රීති.